සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| **ශ්‍රී ලංකා ඉතිහාසය** | **I (I කොටස)** |
| இலங்கை வரலாறு | I (பகுதி I) |
| History of Sri Lanka | I (Part I) |

**25 S I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**විභාග අංකය:** ..................................

***උපදෙස්:***

* ※ මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
* ※ **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* ※ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* ※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) විහාරේගල (2) හබැස්ස (3) තම්මැන්නාව (4) බූන්දල (5) පාලුමැකිච්චාව (.........)

**2.** (1) ගෝනනදී (2) මහානදී (3) ජජ්ජරනදී (4) කප්පකන්දරනදී (5) කදම්බනදී (.........)

**3.** (1) පඨවිපති (2) භූපතී (3) මහීපති (4) පෘථිවීශ්වර (5) ගණපති (.........)

**4.** (1) දෙවනගල (2) ගුත්තහාල (3) වාකිරිගල (4) මහානාගහුල (5) පලුටඨගිරි (.........)

**5.** (1) මහාලාන කිත්ති (2) නිශ්ශංකමල්ල (3) වීරබාහු (4) චෝඩගංග (5) සාහස්සමල්ල (.........)

**6.** (1) උඩුනුවර (2) යටිනුවර (3) සබරගමුව (4) හාරිස්පත්තුව (5) දුම්බර (.........)

**7.** (1) දියෝගෝ ද කුටෝ (2) ජුවාන් ද බැරෝස් (3) ගැස්පර් කොරයා (4) ෆර්නාවෝ ද ක්වේරෝස් (5) පිලිප්පුස් බැල්ඩියෙස් (.........)

**8.** (1) රොබට් බ්‍රවුන්රිග් (2) එඩ්වඩ් බාන්ස් (3) යාන් මාට්සුයිකර් (4) ජෝර්ජ් ඇන්ඩර්සන් (5) ඇන්ඩෲ කැල්ඩිකොට් (.........)

**9.** (1) අයිවර් ජෙනිංස් (2) හෙන්රි මන්ක් මේසන් මුවර් (3) ඔලිවර් ගුණතිලක
(4) විලියම් ගොපල්ලව (5) සෝල්බරි සාමි (.........)

**10.** (1) ජෝන් කොතලාවල (2) ඩබ්. දහනායක (3) ඩී.බී. ජයතිලක
(4) ඩඩ්ලි සේනානායක (5) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.**
(1) කලා ඔය - කලා වැව
(2) මල්වතු ඔය - නාච්චදූව වැව
(3) යාන් ඔය - හුරුලු වැව
(4) කනකරායන් ආරු - ඉරණමඩු වැව
(5) දැදුරු ඔය - මහකනදරා වැව (.........)

**12.**
(1) වේවැල්කැටිය සෙල්ලිපිය - පැරණි නීති ක්‍රමයට අදාළ තොරතුරු
(2) සංගමු විහාර සෙල්ලිපිය - කාලිංග වංශයට අදාළ තොරතුරු
(3) බදුල්ල ටැම් ලිපිය - වෙළෙඳපළක පරිපාලනයට අදාළ තොරතුරු
(4) මැදවල විහාර සෙල්ලිපිය - රජවරු දෙදෙනකු අතර ඇති වූ සම්මුතියකට අදාළ තොරතුරු
(5) තිඹිරිවැව සෙල්ලිපිය - වැවක අයිතියට අදාළ තොරතුරු (.........)

**13.**
(1) ශේගරාශශේඛරමාලෛයි - යාපන රාජධානියට අදාළ දෙමළ ඉතිහාස ග්‍රන්ථයකි
(2) සමන්තපාසාදිකා - විනය පිටකයට අයත් අටුවා ග්‍රන්ථයකි
(3) හත්ථවනගල්ලවිහාර වංසය - අත්තනගල්ල විහාරය පිළිබඳ වර්ණනාවකි
(4) සහස්සවත්ථුප්‍රකරණය - ස්තූප ඉදිකිරීමට අදාළ ග්‍රන්ථයකි
(5) සඟරාජවත - සරණංකර තෙරුන් පිළිබඳව ලියැ වී ඇති ග්‍රන්ථයකි (.........)

**14.**
(1) උඩරට රාජධානියේ ප්‍රථම පාලකයා - සේනාසම්මත වික්‍රමබාහු
(2) යාපන රාජධානියේ ප්‍රථම පාලකයා - සෙම්බග පෙරුමාල්
(3) පළමුවන පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා - පේද්‍රෝ ලෝපේස් ද සූසා
(4) සීතාවක රාජධානියේ ප්‍රථම පාලකයා - මායාදුන්නේ
(5) නායක්කර් වංශයෙහි පළමුවන පාලකයා - ශ්‍රී විජය රාජසිංහ (.........)

**15.**
(1) පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
(2) ඒ.ඊ. ගුණසිංහ - ලංකා කම්කරු පක්ෂය
(3) ජී.ජී. පොන්නම්බලම් - සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය
(4) එන්.එම්. පෙරේරා - ලංකා සමසමාජ පක්ෂය
(5) එෆ්.ආර්. සේනානායක - එක්සත් ජාතික පක්ෂය (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) පත්තපාසානවාපි | A - පදවිය වැව |
| (ii) මණිහිරිවාපි | B - මහමඩගල්ල වැව |
| (iii) පදින්නෝරුවාපි | C - නාච්චදූව වැව |
| (iv) මණ්ඩවාටකවාපි | D - මින්නේරිය වැව |
| (v) අභයවාපි | E - බසවක්කුලම වැව |

(1) C A B E D (2) C B A D E (3) C D A B E (4) C D B E A (5) C E B A D (.........)

**17.** X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | ලංකාපුර | A | - පළමුවන පරාක්‍රමබාහු |
| (ii) | මිගාර | B | - වට්ටගාමිණී අභය |
| (iii) | රවිදේව | C | - පළමුවන විජයබාහු |
| (iv) | කපිසීස | D | - දුට්ඨගාමිණී |
| (v) | ථෙරපුත්තාභය | E | - ධාතුසේන |

(1) AECBD (2) AECDB (3) AEDBC (4) AEBCD (5) AEBDC (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | කණ්ඨක චෛතිය | A | - අනුරාධපුරය |
| (ii) | වෙස්සගිරිය | B | - මිහින්තලය |
| (iii) | තිවංක පිළිමගෙය | C | - පොළොන්නරුව |
| (iv) | විජයසුන්දරාරාමය | D | - කුරුණෑගල |
| (v) | රිදීවිහාරය | E | - දඹදෙණිය |

(1) BAECD (2) BAEDC (3) BACED (4) BADEC (5) BACDE (.........)

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මහ බද්ද | A | - අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (ii) | කොට්ටල් බද්ද | B | - ප්‍රවාහන කාර්යාංශය |
| (iii) | කුරුවේ බද්ද | C | - කුරුඳු පිළිබඳ කාර්යාංශය |
| (iv) | මඩිගේ බද්ද | D | - ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (v) | කින්නර බද්ද | E | - වියීමේ කාර්යාංශය |

(1) CDAEB (2) CDBAE (3) CDEAB (4) CDABE (5) CDEBA (.........)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ෆෙඩ්රික් නෝර්ත් | A | - ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම |
| (ii) | එඩ්වර්ඩ් බාන්ස් | B | - ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම |
| (iii) | විලියම් හෝර්ටන් | C | - කෞතුකාගාරය පිහිටුවීම |
| (iv) | විලියම් ග්‍රෙගරි | D | - කොළඹ - නුවර මාර්ගය ඉදිකිරීම |
| (v) | හෙන්රි මැකලම් | E | - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම |

(1) BADCE (2) BACDE (3) BDACE (4) BACED (5) BADEC (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. පොළොන්නරු යුගයේ පරිපාලනය**

(1) රජු පරිපාලන යාන්ත්‍රණයේ ප්‍රධානියා විය.
(2) රජතුමා යුක්තිධර්මයෙහි උල්පත ලෙස සලකනු ලැබී ය.
(3) පියාගෙන් පුතාට පමණක් රජකම උරුම විය.
(4) ඉඩම් බද්ද රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය විය.
(5) රාජ්‍යය තුළ පිහිටි සියලු ඉඩම්වල හිමිකම රජු සතු යැයි සැලකුණි. (.........)

**22. රයිගම**

(1) අලකේශ්වර පවුලේ ජාතගාමය රයිගම විය.
(2) රයිගම විසූ වීර අලකේශ්වර කෝට්ටේ බලකොටුව ඉදි කළේ ය.
(3) හයවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය පාලනය රයිගමින් ඇරඹිණි.
(4) විජයබා කොල්ලයෙන් පසුව රයිගම් බණ්ඩාර රයිගම පාලකයා විය.
(5) බාරස කාව්‍යය රයිගම දී රචනා කරන ලදී. (.........)

**23.** **පළමුවන රාජසිංහ රජතුමා**

(1) මායාදුන්නේ රජුගෙන් පසුව සීතාවක රාජධානියේ පාලකයා විය.
(2) මුල්ලේරියා සටනේ දී පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළේ ය.
(3) පළමුවන රාජසිංහ රජතුමා ලංකාවේ පෘතුගීසි බලය අවසන් කළේ ය.
(4) වසර දහයක් පමණ උඩරට රාජධානිය පාලනය කිරීමට ඔහු සමත් විය.
(5) ළමා කාලයේ දී ඔහු ටිකිරි කුමරු යන නාමයෙන් හැඳින්විණි. (.........)

**24.** **ආනන්ද කුමාරස්වාමි**

(1) ශ්‍රීමත් මුතු කුමාරස්වාමි ඔහුගේ පියා විය.
(2) ඔහු ලංකා ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවීමෙහිලා පුරෝගාමියකු විය.
(3) 'මධ්‍යකාලීන සිංහල කලා' නම් කෘතිය ඔහු විසින් රචනා කරන ලදී.
(4) හෙතෙම වෘත්තියෙන් භූගර්භ විද්‍යාඥයකු විය.
(5) ඔහු සීගිරි චිත්‍ර ප්‍රතිසංස්කරණය කළ රසායන විද්‍යාඥයා විය. (.........)

**25.** **1977 වර්ෂයේ දී පැවැත් වූ මහ මැතිවරණයෙන් පසු තත්ත්වය**

(1) 1977 මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශිෂ්ට ජයක් අත්විණි.
(2) ජේ.ආර්. ජයවර්ධන මහතා මෙම මැතිවරණයෙන් පසුව අගමැති තනතුරට පත් විය.
(3) 1977 මැතිවරණයෙන් පසුව ආනන්ද තිස්ස ද අල්විස් මහතා කථානායක බවට පත් විය.
(4) 1977 මැතිවරණයෙන් පසුව රොනී ද මැල් මහතා මුදල් ඇමති තනතුරට පත් කරනු ලැබී ය.
(5) 1977 මැතිවරණයෙන් පසුව ඒ. අමිර්තලිංගම් මහතා විපක්ෂ නායක තනතුරට පත් විය. (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** පණ්ඩුකාභය රජුගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ලංකාවෙන් සොයා ගෙන ඇති පැරණිතම සෙල්ලිපි පණ්ඩුකාභය රජුගේ කාලයට අයත් වේ.
(B) පණ්ඩුකාභය රජු පාණ්ඩ්‍ය කුමාරිකාවක් විවාහ කරගත් බව මහාවංසයේ සඳහන් වේ.
(C) පණ්ඩුකාභය රජු මෙරට ග්‍රාම සීමා සලකුණු කරන ලද බව මහාවංසයේ සඳහන් වේ.
(D) වංසකථාවලට අනුව පණ්ඩුකාභයගේ මව වූයේ චිත්‍රා ය. (.........)

**27.** රෝහණ රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) දේවානම්පිය තිස්ස රජුගේ සොහොයුරු මහානාග මාගම සිට රෝහණ දේශය පාලනය කළේ ය.
(B) කාජරගාමයේ දසබතිකයින් පරාජය කළ ගෝඨාභය රජු රෝහණ රාජ්‍යයේ බලය ව්‍යාප්ත කළේ ය.
(C) යටාලතිස්ස සේරු, සෝම සහ ලෝන රාජධානි රෝහණ රාජ්‍යයට ඈඳා ගත්තේ ය.
(D) කාවන්තිස්ස රජු හල්ලුක පරාජය කිරීමෙන් රෝහණ රාජධානියෙහි බලය තවදුරටත් පැතිරවීමට සමත් විය. (.........)

[පස්වැනි පිටුව බලන්න.

**28.** ගම්පළ රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) හතරවන බුවනෙකබාහු රජු ගම්පළ රාජධානියෙහි පළමුවන පාලකයා විය.
(B) මයූර සහ තිසර සංදේශ ගම්පළ සමයේ දී රචනා කොට තිබේ.
(C) සේනාලංකාධිකාර සහ අලගක්කෝනාර යනු ගම්පළ රාජධානි සමයෙහි සිටි බලවත් ප්‍රභූ පවුල් දෙකකි.
(D) ගඩලාදෙණිය හා ලංකාතිලක විහාර ගම්පළ රාජධානි සමයේ දී ඉදිකොට තිබේ. (………)

**29.** උඩරට රාජධානියෙහි නායක්කර් පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු නායක්කර් වංශයේ පළමුවන පාලකයා විය.
(B) කීර්ති ශ්‍රී රාජසිංහ රජු නායක්කර් පෙළපතෙහි විශිෂ්ටතම පාලකයා ලෙස සලකනු ලැබේ.
(C) හිටපු රජුගේ අග බිසවගේ සොහොයුරාට රජකම ලබාදීමේ සම්ප්‍රදාය නායක්කර් පාලකයින් විසින් අනුගමනය කරන ලදී.
(D) රාජාධිරාජසිංහ රජු නායක්කර් පෙළපතෙහි අවසන් පාලකයා ලෙස සලකනු ලැබේ. (………)

**30.** බ්‍රිතාන්‍ය පාලන සමයේ දී දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා මෙරට පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උනන්දුවෙන් කටයුතු කළේ ය.
(B) ටොරිංටන් ආණ්ඩුකාරවරයා පොළොන්නරුවේ පිහිටි වැව් ගණනාවක් ම ප්‍රතිසංස්කරණය කළේ ය.
(C) වී ගොවිතැන නගා සිටුවීමේ පරමාර්ථයෙන් මෙම අවධියේ දී ගොවිජනපද කිහිපයක් ම පිහිටුවනු ලැබී ය.
(D) බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු ගල්ඔය ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළහ. (………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** පළමුවන පරාක්‍රමබාහු රජුගේ බුරුම ආක්‍රමණය ගැන තොරතුරු සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) ගල්විහාර ලිපිය (2) දෙවනගල ලිපිය (3) නයිනතිවු ලිපිය
(4) සංගමු විහාර ලිපිය (5) මඩවල ගිරිලිපිය (………)

**32.** යාපහුව රාජධානියේ පළමුවන පාලකයා කවරෙක් ද?
(1) පළමුවන බුවනෙකබාහු (2) දෙවන පරාක්‍රමබාහු (3) තුන්වන විජයබාහු
(4) හතරවන විජයබාහු (5) දෙවන බුවනෙකබාහු (………)

**33.** 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය සිදුවන අවස්ථාවෙහි මෙරට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවරෙක් ද?
(1) හියු ක්ලිෆර්ඩ් (2) ජෝන් ඇන්ඩර්සන් (3) ග්‍රැහැම් තොම්සන්
(4) රොබට් චාමර්ස් (5) හර්බට් ස්ටැන්ලි (………)

**34.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ අධ්‍යයනය කළ පළමුවන ස්වදේශික පර්යේෂකයා කවරෙක් ද?
(1) සෙනරත් පරණවිතාන (2) සී.ඊ. ගොඩකුඹුර (3) ජේම්ස් ටී. රත්නම්
(4) පී.ඊ.පී. දැරණියගල (5) ජස්ටින් දැරණියගල (………)

**35.** වී පර්යේෂණායතනය පිහිටි ස්ථානය කුමක් ද?
(1) අගලවත්ත (2) බතලගොඩ (3) ලුණුවිල
(4) හන්තාන (5) තලවකැලේ (………)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | උත්තර විහාරට්ඨ කථාව පදනම් කොටගෙන දීපවංසය රචනා කර තිබේ. | කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු මෙරට වැඩිම සෙල්ලිපි සංඛ්‍යාවක් පිහිටුවා ඇති පාලකයා ලෙස සලකනු ලැබේ. | (.........) |
| **37.** | යාපන රාජධානියෙහි පාලකයා ගම්පළ රාජධානියට අයත් ප්‍රදේශ ආක්‍රමණය කළ බව වාර්තා වේ. | කුරුණෑගල සමයෙහි දී චන්ද්‍රබානු ලංකාව ආක්‍රමණය කළේ ය. | (.........) |
| **38.** | දන්තුරේ සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා වූයේ දියෝගෝ ද මෙලෝ ද කස්ත්‍රෝ ය. | මොරටුව ප්‍රදේශයෙහි ගෘහභාණ්ඩ සෑදීමේ කර්මාන්තය ලන්දේසි පාලන සමයේ දී ආරම්භ වී යැයි සලකනු ලැබේ. | (.........) |
| **39.** | ජේම්ස් ටේලර් විසින් ලංකාවේ පළමුවන තේ වත්ත ආරම්භ කරන ලදී. | ඉංග්‍රීසින් විසින් ලංකාවට මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දෙන ලදී. | (.........) |
| **40.** | නිදහසින් පසුව මෙරට පළමුවන මුදල් ඇමතිවරයා වූයේ ජේ.ආර්. ජයවර්ධන මහතා ය. | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන විට සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිණිය මෙරට අගමැතිනිය වූවා ය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය I<br>இலங்கை வரலாறு I<br>History of Sri Lanka I | | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | |
|---|---|---|---|
| (i) මාගම | (ii) දීඝවාපි | (iii) ජජ්ජර නදී | (iv) යෝධවැව |
| (v) මිහින්තලේ | (vi) කලාවැව | (vii) යාපනය | (viii) කළු ගඟ |
| (ix) කටුගස්තොට | (x) ත්‍රිකුණාමලය | (xi) මිණිපේ | (xii) උතුරු මැද පළාත |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** "පුරාතන ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය වාර්තා කොට ඇති වැදගත්ම වංසකථාව මහාවංසයයි"

(i) මහාවංසයේ පළමුවන කොටසේ කතුවරයා වාසය කළ පිරිවෙන නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) මහාවංසයේ පළමුවන කොටසේ සඳහන් වන අවසාන පාලකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසය කෙතරම් වැදගත් වන්නේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

(iv) අනුරාධපුර යුගයේ ආර්ථික ක්‍රමය හැදෑරීම සඳහා මහාවංසය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

**3.** (i) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයේ දී බුදුදහම ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

(ii) අනුරාධපුර යුගයෙහි දී බුදු සමයේ හා භික්ෂු ශාසනයේ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් ගෙනහැර දක්වන්න. (ලකුණු 08 යි)

**4.** "පළමුවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමය පුරාතන ශ්‍රී ලාංකේය වාරි කර්මාන්තයෙහි වර්ධනයේ උච්චස්ථානය සලකුණු කරයි."

(i) අනුරාධපුර යුගයේ දී විශාල පරිමාණයේ වැව් ඉදිකළ පාලකයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අනුරාධපුර යුගයේ දී ඉදිකරන ලද ඇළ මාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය වර්ධනය කිරීමෙහි ලා ඉටු කරන ලද කාර්යභාරය විචාරාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 12 යි)

අටවැනි පිටුව බලන්න.

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වසභ රජතුමා
(ii) මාඝ ආක්‍රමණය
(iii) කුරුණෑගල යුගය
(iv) සපුමල් කුමාරයා

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් සිය බලය ස්ථාපිත කරගත් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "දෙවන රාජසිංහ රජු මිරිස් දී ඉඟුරු ගත්තේ ය."

(i) දෙවන රාජසිංහ ළමා කාලයේ දී හැඳින්වූ නම කුමක් ද? (ලකුණු 01 යි)
(ii) දෙවන රාජසිංහ රජුගේ පියා සහ මව නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) උඩරට රජු සහ ලන්දේසීන් අතර අත්සන් කරන ලද 1638 ගිවිසුම සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට එරෙහිව දෙවන රාජසිංහ රජු අනුගමනය කළ ප්‍රතිපත්තිය විස්තර කිරීමට ඉහත සඳහන් උධෘතය කෙතෙක් දුරට යෝග්‍ය දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** දහනව වන සියවසේ දී ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ වර්ධනය සඳහා බලපෑ ඇති ප්‍රධාන සාධක පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය
(ii) ඉඩම්
(iii) ශ්‍රමය

(ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පෘතුගීසීන් අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තිය
(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර පැවති සබඳතා
(iii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කර ගැනීම
(iv) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 25 - ශ්‍රී ලංකා ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 25 - ශ්‍රී ලංකා ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | |
|---|---|---|---|---|
| **I පත්‍රය** | = | 01 x 40 | = | 40 |

**II පත්‍රය**

| | | |
|---|---|---|
| **අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු** | = | 12 |
| **සෙසු ප්‍රශ්න 03 කට 16 බැගින්** | = | 48 |
| **II පත්‍රය අවසාන ලකුණු** | = | 60 |

**අවසාන ලකුණු = 40 + 60 = 100**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ :ප්‍රශ්න අංක 03**

(i) ............................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

### ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப்பரீட்சை - 2024

විෂයය අංකය / பாட இலக்கம் **25**

විෂයය / பாடம் **ශ්‍රී ලංකා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 05 | 21. | 03 | 31. | 02 |
| 02. | 02 | 12. | 02 | 22. | 05 | 32. | 01 |
| 03. | 05 | 13. | 04 | 23. | 03 | 33. | 04 |
| 04. | 01 | 14. | 02 | 24. | 05 | 34. | 04 |
| 05. | 01 | 15. | 05 | 25. | 01 | 35. | 02 |
| 06. | 03 | 16. | 03 | 26. | 04 | 36. | 04 |
| 07. | 05 | 17. | 01 | 27. | 01 | 37. | 01 |
| 08. | 03 | 18. | 03 | 28. | 05 | 38. | 04 |
| 09. | 01 | 19. | 04 | 29. | 03 | 39. | 01 |
| 10. | 03 | 20. | 03 | 30. | 02 | 40 | 02 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය<br>இலங்கை வரலாறு<br>History of Sri Lanka | I<br>I<br>I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ............................



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024

ඉතිහාසය I (II කොටස)

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.)

## A කොටස

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) මාගම (ii) දීඝවාපී (iii) ජජ්ජර නදී (iv) යෝධවැව

(v) මිහින්තලේ (vi) කලාවැව (vii) යාපනය (viii) කළු ගඟ

(xi) කටුගස්තොට (x) ත්‍රිකුණාමලය (xi) මීණිපේ (xii) උතුරුමැද පළාත

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගි

## B කොටස

(2) “පුරාතන ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය වාර්තා කොට ඇති වැදගත් ම වංසකතාව මහාවංසයයි.”

(i) මහාවංසයේ පළමුවන කොටසේ කතුවරයා වාසය කළ පිරිවෙන නම් කරන්න.

දික්සඳ සෙනෙවියා පිරිවෙන / දීඝසන්ද පිරිවෙන

(ලකුණු 0

(ii) මහාවංසයේ පළමුවන කොටසේ සඳහන්වන අවසාන පාලකයා නම් කරන්න.

මහසෙන් රජු (මහාසේන)

(ලකුණු 0

**(iii) අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසය කෙතරම් වැදගත් වන්නේ දැයි පරීක්ෂා කරන්න.**

*මහාවංසය* යනු කාලානුක්‍රමිකව හා සවිස්තරාත්මකව ලංකා ඉතිහාසයෙහි පැරණි අවධිය පිළිබඳව තොරතුරු ගෙන එන ප්‍රධානතම මූලාශ්‍රයයි. *මහාවංසයේ* 55 වන පරිච්ඡේදය තෙක් අනුරාධපුර යුගයේ රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය විස්තර කර තිබේ. මෙම මූලාශ්‍රය මගින් දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාදෙන ආකාරය පහත සඳහන් අංශ ඔස්සේ හඳුනාගත හැකිය:

❖ අඛණ්ඩ රාජනාමාවලියක් ඉදිරිපත් කොට තිබීම.

❖ ලංකා ඉතිහාසය ගොඩනැගීමෙහිලා කැපී පෙනෙන භූමිකාවක් ඉටුකළ රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය විස්තර කොට තිබීම.

උදා: පණ්ඩුකාභය, දුටුගැමුණු, වළගම්බා, ධාතුසේන, මහසෙන් ආදී පාලකයන්

❖ විදේශ සම්බන්ධතා සහ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ තොරතුරු ලබාදීම.

- අශෝක අධිරාජයා සමග සබඳතා සහ රාජාභිෂේකය
- සේන-ගුත්තික / එළාර / පංච ද්‍රවිඩ - පුලහත්ථ, බාහිය, පනයමාර, පිළයමාර, දාඨිය (දාඨික) / ෂඩ් ද්‍රවිඩ - පණ්ඩු, පාරින්ද, ඛුද්දපාරින්ද, තිරිතර, දාඨිය (දාඨික), පීඨිය

❖ රාජ්‍ය උරුමය ලැබී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ලබාදීම

- පියාගෙන් පුතාට
  - ✓ මුටසීවගෙන් -දේවානම්පියතිස්සට
  - ✓ සද්ධාතිස්සගෙන් - ථුල්ලත්ථනට
- සහෝදරයාගෙන් සහෝදරයාට
  - දුටුගැමුණුගෙන් - සද්ධාතිස්සට

❖ රාජවංශ පිළිබඳ තොරතුරු හෙළිකිරීම.

උදා: මෞර්ය / ලම්භකර්ණ

❖ ඒ ඒ රජවරු කරන ලද වැදගත් කටයුතු පිළිබඳව හෙළිකිරීම.

❖ දේශපාලනයෙහිලා කාන්තාවගේ දායකත්වය පිළිබඳ තොරතුරු ලබාදීම.

- පාලනය - අනුලා බිසව, සීවලී බිසව
- දේශපාලනයට මැදිහත්වීම - විහාර මහා දේවිය

❖ ප්‍රාදේශීය පාලනය පිළිබඳ තොරතුරු ලබාදීම.

- මාගම, නාගදීපය, කැලණිය, සේරු නුවර.

❖ විදේශීය කුලී හමුදා සේවය ලබාගැනීම (ඉලනාග, පළමුවෙනි මුගලන්, මානවම්ම), උපරාජවරුන්, සෙන්පතියන් හා හමුදා සංවිධානය ආදිය පිළිබඳ තොරතුරු ලබාදීම.

*මහාවංසයේ* සඳහන් වන දේශපාලන තොරතුරුවල සත්‍යාසත්‍යතාව අභිලේඛන ඇතුළු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් තහවුරු කරගත හැකිවීම (කුසලානකන්ද, බෝවත්තේගල, වැලඑල්ලුගොඩ, කොටාදැමූහෙල, වෙස්සගිරිය, මහරත්මලේ, තිඹිරිවැව, කොරවග්ගල, සිතුල්පව්ව, වල්ලිපුරම් රන්පත).

**(ලකුණු 07 යි)**

**(iv) අනුරාධපුර යුගයේ ආර්ථික ක්‍රමය හැදෑරීම සඳහා මහාවංසය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.**

❖ ආර්ථිකයේ වැදගත් අංශ වන කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, සත්ව පාලනය හා වෙනත් කර්මාන්ත පිළිබඳ තොරතුරු *මහාවංසයේ* අන්තර්ගතව තිබේ.

❖ **කෘෂිකර්මාන්තය:**

- ඈත අතීතයේ පටන් වී ගොවිතැන ජීවනෝපාය මාර්ගය වීම.

  වසරකට කන්න දෙකක් හෝ තුනක් වී වගා කළ බව සඳහන් කිරීම (පිට දඩ හස, මදෙහස, අකල හස).
- ගොඩ ඉඩම්වල හැල් වී (සාලිය කුමරා පිළිබඳ කතා පුවත - හැල් කෙත්) මෙන්ම උඳු, මුං, තණ හාල්, වරා යන ධාන්‍ය වගාව පිළිබඳ තොරතුරු දක්වා තිබීම.
- හේන් වගාව පිළිබඳ සඳහන් වීම
- අඹ, පොල්, උක් ආදී වෙනත් වගාවන් පැවති බව දැක්වීම.
- ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ තොරතුරු හමුවීම. සෙල්ලිපි තුළින්ද ඉඩම් පිළිබඳ කරුණු තහවුරු වීම (තෝණිගල, පෙරුමියන්කුලම්, තිඹිරිවැව සෙල්ලිපි).
- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ නිලධාරීන් පිළිබඳ තොරතුරු හෙළිවීම
- ගොවිතැනට අදාළ විවිධ බදු පිළිබඳ තොරතුරු හෙළිවීම - (භොජකපති හෙවත් භොජියපති).
- වාරි කර්මාන්ත පිළිබඳ තොරතුරු රැසක් හමුවීම.

  ඒ යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් වැව් හා වෙනත් වාරි කර්මාන්ත ඉදිකරවීම (වසභ, මහසෙන්, ධාතුසේන, පළමුවන අග්ගබෝධි, දෙවන අග්ගබෝධි).

  දිය බද්ද (උදක භාග) ආදිය පිළිබඳ තොරතුරු හෙළිවීම.
- සත්ව පාලනය (ගවයින් හා සී සෑම වැනි දෑ ගැන සඳහන්ව තිබීම)

❖ **වෙළෙඳාම**

- අභ්‍යන්තර වෙළෙඳාම යටතේ වෙළෙඳ සල්පිල් (සුරනිමල යෝධයා සම්බන්ධ කතාව) හා වෙළඳසැල් පැවතීම පිළිබඳ තොරතුරු හෙළිවීම.
- විදේශීය වෙළෙඳාම යටතේ වෙළෙඳ තොටුපළවල් පිළිබඳ තොරතුරු (මහාතිත්ථ, දඹකොළපටුන, ගොඩවාය) සහ වෙළෙන්දන් පිළිබඳ තොරතුරු හෙළිවීම.
- දේශීය හා විදේශීය කාසි රැසක් හමුවීම
- කර්මාන්ත (කුඹල් කර්මාන්තය, කම්මල්කරුවන්, මාලාකරුවන් පිළිබඳව වාර්තාවීම).

**(ලකුණු 07 යි)**

3. (i) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී බුදුදහම ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය පරීක්ෂා කරන්න.

(ii) අනුරාධපුර යුගයෙහි දී බුදු සමයේ හා භික්ෂු ශාසනයේ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් ගෙන හැර දක්වන්න.

(i) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී බුදුදහම ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය

- ❖ ඉන්දියාවේ අසෝක අධිරාජයා සහ ලංකාවේ දේවානම්පිය තිස්ස රජු අතර පැවති රාජ්‍යතාන්ත්‍රික සබඳතාවේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපිතවීම.
- ❖ දේශීය වශයෙන් සංවිධානාත්මක ආගමක් නොපැවතීම, මෙරට බුදුදහම ස්ථාපිතවීමට හේතුවක් වීම.
- ❖ මිහිඳු හිමියන් ප්‍රමුඛ ධර්මදූත පිරිසගේ ආගමනය හා දේවානම්පිය තිස්ස රජතුමා ඇතුළු රාජකීයයන් එම දහම පිළිගැනීම.
- ❖ භණ්ඩුක උපාසක පැවිදි කරවීම හා මෙරට භික්ෂු ශාසනය ආරම්භ කිරීම.
- ❖ සුමන සාමණේරයන් උපසම්පදා කොට ලක්දිව ප්‍රථම උපසම්පදාව පැවැත්වීම.
- ❖ රාජකීය උද්‍යානය වූ මහමෙව්නාව දේවානම්පිය තිස්ස රජු විසින් බුද්ධ ශාසනයට පූජා කිරීම හා මිහිඳු හිමියන්ගේ මගපෙන්වීමෙන් මහාවිහාර සීමාව සලකුණු කොට අටමස්ථාන පිහිටුවීමට පසුබිම සැකසීම.
- ❖ මිහින්තලේ අටසැට ලෙන් පූජාව හා ප්‍රථම වස්වාසිකය සිදු කිරීම.
- ❖ දුමින්දාගමනය හා ඒ සමග අටළොස් කුල පිරිසක් ලංකාවට පැමිණීම.
- ❖ ලක්දිව අට දිසාවකට බෝධීන් වහන්සේ වැඩම කරවා බුදුදහමත් බෝධි සංස්කෘතියත් ව්‍යාප්ත කරවීම.
- ❖ සංඝමිත්තා මෙහෙණියගේ මූලිකත්වයෙන් අනුලා දේවිය ඇතුළු කාන්තාවන් පැවිදිකොට භික්ෂුණී ශාසනය පිහිටුවීම. භික්ෂුණී ශාසනය වෙනුවෙන් උපාසිකාරාමය හා හත්ථාල්හක මෙහෙණවර ඇති කිරීම.
- ❖ බුදුන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කොට ථූපාරාම ස්තූපය ගොඩනැංවීම හා ස්තූප වන්දනා සංස්කෘතියක් ඇති කිරීම.
- ❖ අරිට්ඨ කුමරු පැවිදි-උපසම්පදා කරවා ථූපාරාම භූමියේ දී පළමු විනය සංගායනාව පැවැත්වීම.
- ❖ බුද්ධ ශාසනයට කෙටි කලක් ඇතුළත විශාල භික්ෂු-භික්ෂුණී පිරිසක් ඇතුළත් වීම සහ රාජකීයයන්ගේ අනුග්‍රහය ලද බුද්ධාගම සංවිධානාත්මක ආගමක් ලෙස ව්‍යාප්ත වීම.

**(ලකුණු 08 යි)**

(ii) අනුරාධපුර යුගයෙහි දී බුදු සමයේ හා භික්ෂු ශාසනයේ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම්

- ❖ දේවානම්පිය තිස්ස රජුගෙන් පසුව ථෙරවාදී බුදුදහමේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත්වීම.
- ❖ දුටුගැමුණු රජතුමා ස්වකීය සටන් ව්‍යාපාරයට භික්ෂූන් වහන්සේ සම්බන්ධ කර ගැනීම නිසා දේශපාලනයට භික්ෂූන් සෘජුව මැදිහත්වීමට මුලපිරීම.

- ❖ මහාවිහාරවාසී භික්ෂූන්ගේ විනය පිරිහීම නිසා සද්ධාතිස්ස රජු මහාවිහාරයට උපකාර නොකොට චේතියගිරිය හෙවත් මිහින්තලේට අනුග්‍රහ දැක්වීම.
- ❖ වළගම්බා රාජ්‍ය සමයේ ඇතිවූ බැමිණිතියා සාගතයේ ප්‍රතිඵලයක් ලෙස භික්ෂූන් වහන්සේ මියයාම, රට හැරයාම ආදී හේතු නිසා එතෙක් මුඛපරම්පරාවෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටකයේ පැවැත්මට අභියෝග එල්ලවීම. එම පසුබිම හේතු කොට ගෙන ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
- ❖ වළගම්බා රජතුමා කුපික්කලතිස්ස තෙරුණ්ට අභයගිරි විහාරය පුද්ගලික ආරාමයක් ලෙස පූජාකිරීම හේතු කොට ගෙන මහාවිහාර-අභයගිරි උභය විහාර පාර්ශව ඇතිවීම.
- ❖ කුපික්කලතිස්ස හිමියන්ගේ ශිෂ්‍යයෙකු වූ බාලමස්සුතිස්ස හිමියන් විශාල ශිෂ්‍ය පිරිසක් සමග මහාවිහාරයෙන් බැහැරවී අභයගිරි විහාරයේ පදිංචිවීම නිසා අභයගිරි විහාරයේ බලය වැඩිවීම.
- ❖ ඉන්දීය මහායාන සම්ප්‍රදායයට අයත් ධම්මරුචි නිකායේ භික්ෂු පිරිසක් අභයගිරි විහාරයට පැමිණ, අභයගිරි විහාර සම්ප්‍රදාය තුළ මහායාන ධම්මරුචි සම්ප්‍රදායය ආරම්භ කිරීම.
- ❖ අභයගිරි විහාරය වජිරියවාදය පිළිගැනීම.
- ❖ භාතිකාභය රාජ්‍ය සමයේදී භික්ෂු විනය පිළිබඳ අර්බුද ඇතිවීම හා රජුගේ මැදිහත්වීමෙන් දීඝකාරායන නම් ඇමතියා එම විනය ගැටලුව සමථයකට පත් කිරීම.
- ❖ වෝහාරිකතිස්ස රාජ්‍ය සමයේදී වෛතුල්‍යවාදය නැවත ඉස්මතුවීම හේතු කොට ගෙන රජු කපිල ඇමති ලවා නිවැරදි ධර්මය විනිශ්චය කරවීම හා වෛතුල්‍යවාදය ථේරීය සම්ප්‍රදායයට පටහැනි බව පෙන්වාදීම. එමෙන්ම වෛතුල්‍යවාදී ධර්ම ග්‍රන්ථ ගිනිබත් කොට, වෛතුල්‍යවාදය පිළිගත් භික්ෂූන් වහන්සේ හැටනමක් (60) හණ ලකුණු තබා කාවේරි පටුනට පිටමං කිරීම.
- ❖ මහසෙන් රාජ්‍ය සමයේ සංඝමිත්‍ර භික්ෂුව මගින් වෛතුල්‍යවාදය පැතිරයාම හා රජු, වෛතුල්‍යවාදය නිවැරදි ධර්මය ලෙස පිළිගෙන මහාවිහාරය විනාශ කිරීම.
- ❖ මහසෙන් රජුගේ මහාවිහාර විනාශයට එරෙහිව විරෝධතා මතුවූ බැවින් රජු එම ක්‍රියාවලිය නවතා දමා මහාවිහාර සීමාවේම ජේතවන නම් නව විහාරයක් ඉදිකරවීම.
- ❖ අභයගිරි විහාරවාසී තිස්ස නම් භික්ෂුවක් ප්‍රධාන කොට ගෙන අභයගිරිවාසී භික්ෂූණ් පිරිසක් හා මහාවිහාරීය භික්ෂූණ් පිරිසක් ජේතවනාරාමයට පැමිණ සාගලික නම් නව නිකායක් පිහිටුවීම.
- ❖ නීලපට දර්ශනය වැනි නව දර්ශන බිහිවීම.
- ❖ බොහෝ රජවරු මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය යන ආරාමවලට භෞතික සම්පත් පූජා කිරීම හේතුවෙන් මෙම ආයතන ආර්ථික වශයෙන් ශක්තිමත් ධර්ම මූලස්ථාන බවට පත්වීම. ඇතැම් භික්ෂූණ් ලෞකිකත්වය වෙත යොමුවීම.
- ❖ මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය මූලික කොටගත් භික්ෂු අධ්‍යාපන ආයතන පිහිටුවීම.
- ❖ අනුරාධපුර යුගයේ අවසාන භාගයේ මිහින්තලය බලවත් ආයතනයක් බවට පත්වීම.
- ❖ කිත්සිරිමෙවන් රාජ්‍ය සමයේ දළදා වහන්සේ ලංකාවට වැඩම කරවීම හේතු කොට ගෙන ධාතු වන්දනා සංස්කෘතියක් ඇතිවීම.
- ❖ අනුරාධපුර යුගය අවසන් භාගයේදී දේශපාලන අර්බුද හේතු කොට ගෙන රාජ්‍ය අනුග්‍රහය නොලැබී යාම සහ විදේශ ආක්‍රමණ හා නිකායාන්තර අර්බුද වැනි දෑ හේතු කොට ගෙන සම්බුද්ධ ශාසනයත් භික්ෂු සමාජයත් පිරිහීමට පත්වීම.

**(ලකුණු 08 යි)**

4. "පළමුවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමය පුරාතන ශ්‍රී ලාංකේය වාරි කර්මාන්තයෙහි වර්ධනයේ උච්චස්ථානය සලකුණු කරයි."

**(i) අනුරාධපුර යුගයේ දී විශාල පරිමාණයේ වැව් ඉදිකළ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න.**

වසභ, මහසෙන්, ධාතුසේන, දෙවන මුගලන්, පළමුවන අග්ගබෝධි, දෙවන අග්ගබෝධි

(ලකුණු 02යි)

**(ii) අනුරාධපුර යුගයේ දී ඉදිකරන ලද ඇළ මාර්ග දෙකක් නම් කරන්න.**

වන්නක ඇළ (කුටකණ්ණ තිස්ස), ඇළහැර ඇළ (වසභ), පබ්බතන්ත ඇළ (මහසෙන්), ජය ගඟ / යෝධ ඇළ (ධාතුසේන), මිණිපේ ඇළ (පළමුවන අග්බෝ).

(ලකුණු 02යි)

**(iii) පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය වර්ධනය කිරීමෙහි ලා ඉටු කරන ලද කාර්යභාරය විචාරාත්මකව විග්‍රහ කරන්න.**

- ❖ වාරි කර්මාන්ත සංවර්ධනයට පළමුවන පරාක්‍රමබාහු රජු තුළ පැවති අධිෂ්ඨානය "අහසින් වැටෙන එක දිය බිඳකුදු ලොකෝපකාරයෙන් තොරව මුහුදට ගලායන්නට ඉඩ නොතබමි" යනුවෙන් ඒ රජු විසින් කරන ලද්දේ යැයි සැලකෙන ප්‍රකාශයෙන් පිළිබිඹු වේ.
- ❖ රජුගේ වාරි කර්මාන්ත ඉදිකැරවීමේ මුල් අවස්ථාව, දක්ඛිණ දේශය පාලනය කළ අවධියයි.
  - ▪ දැදුරු ඔය ආශ්‍රිතව කරන ලද වාරිමාර්ග කටයුතු - කොට්ඨබද්ද, සූකරනිජ්ජර, දෝරදත්තික
  - ▪ අක්කර දහසක පමණ ජල ධාරිතාවක් සහිතව පඬා වැව විශාල කරවීම.
  - ▪ පැරණි වැව් 53 ක් අළුත්වැඩියා කරවීම.
  - ▪ පස්යොදුන් රට සංවර්ධනය කිරීම.
- ❖ මෙම රජුගේ වාරි කර්මාන්ත සංවර්ධනයේ දෙවන අවස්ථාව එළඹෙන්නේ මුළු දිවයිනේම පාලකයා වීමෙන් පසුවය (ක්‍රි. ව. 1153-1186).
  - ▪ පරාක්‍රම සමුද්‍රය ඇතුළු සංකීර්ණ වැව් ජාලයක් නිර්මාණය කරවීම හා වැව් ඒකාබද්ධ කිරීම (සමුද්‍ර සංකල්පය).
  - ▪ සැතපුම් 600 ක පමණ ඇළ මාර්ග සංවර්ධනය කරවීම - අංගමැඩිල්ල ඇළ, කාලිංග ඇළ, ගෝමතී ඇළ.
  - ▪ වැව් ප්‍රතිසංස්කරණය කරවීම - මින්නේරි, ගිරිතලේ, කවුඩුලු, කන්තලේ වැව්.
  - ▪ ලංකාවේ දකුණුදිග ප්‍රදේශයේ වාරි කටයුතු සංවර්ධනය කරවීම.
  - ▪ වංසකතාවලට අනුව මේ රජු ප්‍රධාන වැව් 163 ක්, කුඩා වැව් 2376 ක්, ඇළවේලි 165 ක්, ඇළ මාර්ග 3910 ක්, බිසෝනොටු 341 ක් ඉදිකරවා ඇත. ඊට අමතරව කැඩිබිඳී ගිය ඇළවේලි 1753 ක් පිළිසකර කරවා ඇත.

මෙම කරුණු සලකා බලන විට පුරාතන ලාංකේය වාරි කර්මාන්ත වර්ධනයේ උච්චතම අවස්ථාව පළමුවන පරාක්‍රමබාහු රජ දවස බව කිව හැකිය.

(ලකුණු 12 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i) වසභ රජතුමා

(ii) මාඝ ආක්‍රමණය

(iii) කුරුණෑගල යුගය

(iv) සපුමල් කුමාරයා

(ලකුණු 2×8=16 යි)

(i) වසභ රජතුමා

❖ මෞර්ය වාංශික යසලාලක තිස්ස රජු ඝාතනය කොට සුභ සෙනෙවියා රාජත්වයට පත්වීම ඔහුගෙන් පසුව ප්‍රථම ලම්බකර්ණ වාංශික රජු ලෙස රාජත්වයට පත්වූ වසභට මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේගේ ආශිර්වාදය ලැබීම.

❖ වසභ රජුගේ ආධිපත්‍යය මුළු දිවයින පුරාම පැතිර පැවති බව වංසකතා සහ අභිලේඛනවලින් පැහැදිලි වේ - *මහාවංසය, පූජාවලිය, සමන්තපාසාදිකාව* / අනුරාධපුරයේ තම්මැන්නා සෙල්ලිපිය / උතුරෙන් හමු වූ වල්ලිපුරම් රන් සන්නස / වැල්ලවායේ හබැස්ස සෙල්ලිපිය / දකුණේ සිතුල්පව්ව, තිස්සමහාරාම හා ගොඩවාය ලිපි / නැගෙනහිර මඩකලපුව කාසිමොට්ටෙයි සෙල්ලිපිය.

❖ පොත්තාදේවිය අගමෙහෙසිය බවට පත්කර ගනිමින් වසර 44 ක් සාමකාමීව පාලනය ගෙන යෑම. දේශපාලන වශයෙන් අභ්‍යන්තර කැරලි කෝලාහල හා විදේශ ආක්‍රමණ එල්ල නොවූ පාලන සමයෙකි.

❖ ආර්ථික වර්ධනය උදෙසා කෘෂිකර්මාන්තය දියුණු කිරීම; එහි ලා වාරි කර්මාන්ත දියුණු කිරීම කැපී පෙනේ:

- මහවැව් තැනවීමේ පුරෝගාමියා වීම.
- මහවැව් 11 ක් සහ ඇළවල් 12 ක් ඉදි කරවූ බව *මහාවංසයේ* සඳහන් වේ - මහවිලච්චිය වැව, මානාකැටිය වැව, නොච්චිපොතාන වැව, හිරිවඩුන්න වැව හා ඇලහැර හෙවත් අලිසාර ඇළ. මිණිපේ ඇළ තැනීම ආරම්භ කිරීම.
- උම්මග්ග ජල මාතිකා හෙවත් උමං ජල මාර්ග ඉදිකරවීම.

❖ අනුරාධපුර නගරය අලංකාර කරවීම (උයන් වතු, ජල යන්ත්‍ර සහිත විසිතුරු පොකුණු).

❖ ආගමික වශයෙන් වෙහෙර විහාර ඉදිකරවීම හා ප්‍රතිසංස්කරණය කරවීම - රෝහණයේ චිත්තල පබ්බතයෙහි ස්තූප රැසක් ඉදි කළ බව මූලාශ්‍රයවල සඳහන් වීම. අගමෙහෙසිය පොත්තාදේවිය විසින්ද වටදා ගෙයක් ඉදි කරවීම.

❖ ප්‍රාදේශීය පාලනය ක්‍රමවත් කිරීම

- උතර - රෝහණ දේශය
- දුටග - දක්ෂිණ දේශය
- උතුරු ප්‍රදේශය පාලනයට ඉසිගිරාය ඇමතිවරයා යෙදවීම ආදිය සනාථ වේ.

(ලකුණු 08 යි)

**(ii) මාඝ ආක්‍රමණය**

❖ ක්‍රි. ව. 1215 දී නැගෙනහිර ඉන්දියාවේ කාලිංග දේශයෙන් පැමිණි කාලිංග මාඝ, ලංකාව ආක්‍රමණය කොට, ක්‍රි. ව. 1255 දක්වා (වසර 40 ක්) බලය ලබා ගෙන සිටීම.

❖ පොළොන්නරු රාජධානියේ අවසන් පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍යගේ (මෙම රජුගේ ඇස් උගුල්ලා බලයෙන් පහ කළ බව සඳහන් වේ) තුන්වන රාජ්‍ය වර්ෂයේ දී කේරළ සෙබළුන් 24000ක සේනාවක් සමග පැමිණි පොළොන්නරුව වෙත මෙම දරුණු ආක්‍රමණය එල්ල කිරීම.

❖ භික්ෂූන් වහන්සේට වධහිංසා පැමිණවීම හා ඝාතනය කිරීම, වෙහෙර විහාර කොල්ල කෑම. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් භික්ෂූන් වහන්සේ පොළොන්නරුව අතහැර දමා රුහුණු රටට හා මලය රටට පළා යෑම; ඇතැම් භික්ෂූන් වහන්සේ ඉන්දියාවේ චෝළ හා පාණ්ඩ්‍ය දේශවලට පළායාම; දළදා වහන්සේ කොත්මලේට ගෙන ගොස් සඟවා තබා ගැනීම.

❖ වැව් අමුණු කඩා බිඳදැමීම; පොළොන්නරු වැසියන් සතු වස්තුව කොල්ලකෑම හා ඔවුන්ගේ අත් පා කපා දැමීම ආදී වධහිංසා පැමිණවීම; රාජ්‍ය උරුමකරුවන් හා ප්‍රභූන් පොළොන්නරුවෙන් පළවා හැරීම (ඔවුන් රැකවරණය පතා මායා හා රුහුණු රටවලට පළායාම); මේ හේතු කොට ගෙන පොළොන්නරුව ජනශූන්‍ය ප්‍රදේශයක් වීම.

❖ පොළොන්නරුවෙන් කොල්ලකන ලද වස්තුව ඉන්දියාවට රැගෙන යාම,

❖ මෙලෙස මාඝ ගෙනගිය ක්‍රියාකලාපය පොළොන්නරු රාජධානියේ බිඳවැටීමට හේතුවීම.

❖ නිරිත දෙසට රාජධානි සංක්‍රමණය වීමට මෙම තත්ත්වය හේතු වීම.

❖ දඹදෙණියේ තුන්වන විජයබාහු කාලිංග මාඝට අභියෝගයක් වීම.

❖ තුන්වන විජයබාහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු විසින් ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝ පරාජයට පත් කිරීම **(ලකුණු 08 යි)**

**(iii) කුරුණෑගල යුගය**

❖ හස්තිශෛලපුර, ඇතුගල්පුර යන නම්වලින්ද කුරුණෑගල හඳුන්වනු ලැබේ.

❖ යාපහුව රාජධානියෙන් පසු ක්‍රි. ව. 1300 දී පමණ කුරුණෑගල පාලන මධ්‍යස්ථානය බවට පත්වන අතර එතැන් සිට වසර 41 කින් පසු ක්‍රි. ව. 1341 දී මෙම යුගය නිමාවට පත්වේ.

❖ කුරුණෑගල යුගයේ පළමු පාලකයා වූයේ දෙවන බුවනෙකබාහු රජුය. ඔහුගේ වසර නවයක රාජ්‍ය පාලනයෙන් පසු හතරවන පරාක්‍රමබාහු රාජත්වයට පත්වූ අතර එම කාලය මෙරට සාහිත්‍ය ක්ෂේත්‍රයේ වර්ධනීය අවධියකි.

- *ජාතකට්ඨකථා* නමින් පාලි භාෂාවෙන් පැවති ග්‍රන්ථය *ජාතක පොත් වහන්සේ* නමින් සිංහල බසට පරිවර්තනය කිරීම.
- *දළදා සිරිත, පාලි බෝධිවංසය, එළු අත්තනගලුවංසය, අනාගතවංසය, දළදා පූජාවලිය* වැනි වටිනා සිංහල සාහිත්‍ය ග්‍රන්ථ රචනා කිරීම.

❖ හතරවන පරාක්‍රමබාහු රජුගෙන් පසුව තෙවැනි බුවනෙකබාහු හෙවත් වන්නි බුවනෙකබාහු රජු බලයට පත්වීම.

❖ වන්නි බුවනෙකබාහු රාජ්‍ය සමයෙන් පසුව සිව්වන විජයබාහු හෙවත් සවුළු විජයබාහු රාජත්වයට පත්වීම.

❖ දහතුන් වන සියවස අගභාගයේදී කුරුණෑගල රාජධානි සමය අවසන් වීම රාජධානිය කුරුණෑගල සිට ගම්පොළට රැගෙනයාම.

**(ලකුණු 08 යි)**

**iv) සපුමල් කුමාරයා**

❖ අවසන්වරට ලංකාව එක්සේසත් කළ හයවන පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි. ව. 1412-1467) පුත්‍රස්ථානයේ සපුමල් කුමරු හැදී වැඩුණේය.

❖ එවකට ආර්ය චක්‍රවර්තී පාලකයින් යටතේ පැවති යාපනය යටත් කරගැනීම හයවන පරාක්‍රමබාහු රජු විසින් සපුමල් කුමරුට පවරනු ලැබීම.

❖ සපුමල් කුමරු මුලින්ම දහඅට වන්නි පාලකයන් ජයගෙන ඉන් අනතුරුව යාපනය ජයගැනීම සඳහා ඔවුන්ගේ සහාය ලබා ගත්තේය.

❖ හෙතෙම ජාවක කෝට්ටේ හෙවත් අලිමංකඩදී කණ්ණඩ හමුදාව පරාජය කොට එවකට යාපනයේ පාලකයා වූ කනගශූරිය ශිංගෛ ආරියන් පරාජය කළේය (*කෝකිල සංදේශය* හා *සැළලිහිණි සංදේශය*).

❖ සටනේදී යාපන පාලකයා මියගිය බව *රාජාවලියේ* සඳහන් වන අතර ඔහුගේ ඥාතීන් සිරකරුවන් ලෙස කෝට්ටේ රාජ්‍යයට රැගෙනවිත් ඇත (*ගිරා සංදේශය*).

❖ හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් යාපනයේ පාලකයා ලෙස සපුමල් කුමරු පත් කරන ලද්දේය (*කෝකිල සන්දේශය*).

❖ යාපනයේ ජනතාව 'සෙම්බග පෙරුමාල්' නමින් සපුමල් කුමාරයා හඳුන්වා ඇති අතර ඔහු නල්ලූර් පාලන මධ්‍යස්ථානය වශයෙන් තබාගෙන එහි පාලනය ගෙනයාම.

❖ යාපනයේ කන්දසාමි කෝවිල හෙවත් නල්ලූර් කෝවිල ඉදිකරවීම.

❖ හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව හයවන බුවනෙකබාහු නමින් ඔහු කෝට්ටේ පාලකයා බවට පත්වීම

❖ ඔහුට විරුද්ධව "සිංහල සංගේ" නමින් කැරැල්ලක් ඇති කොට ඇති අතර සපුමල් කුමාරයාගේ සහායට අම්බුළුගල කුමරු ඉදිරිපත් වූයේය. ඔවුහු මේ කැරැල්ල මැඩ පැවැත්වූහ.

**(ලකුණු 08 යි)**

## C කොටස

**6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් සිය බලය ස්ථාපිත කරගත් ආකාරය පරීක්ෂා කරන්න.**

❖ ප්‍රධාන වශයෙන් ආර්ථික අරමුණුද ද්විතියික වශයෙන් ආගමික අරමුණුද පෙරදැරි කරගෙන ලංකාවට පැමිණි පෘතුගීසීහු මෙරට පැවති දේශපාලන අස්ථාවරභාවය හේතුකොටගෙන ප්‍රදේශ ආධිපත්‍යයක් ගොඩනගාගැනීමට පෙළඹුණා හ.

<u>කෝට්ටේ රාජ්‍යය</u>

❖ පෘතුගීසීන් ක්‍රි. ව. 1505 දී ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූයේ අටවන වීර පරාක්‍රමබාහු රජුය. මෙම රජු වෙළඳ ගබඩාවක් හා පල්ලියක් ඉදිකර ගැනීමට පෘතුගීසීන්ට අවසර ලබා දීම.

- ❖ 1521 හය වන විජයබාහු රජුගේ සමයේදී සිදු වූ 'විජයබා කොල්ලය' හේතුකොටගෙන කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීයාම (කෝට්ටේ - හත්වන බුවනෙකබාහු / සීතාවක - මායාදුන්නේ / රයිගම - රයිගම් බණ්ඩාර).
- ❖ පසුව බුවනෙකබාහු හා මායාදුන්නේ අතර හටගත් ගැටුම්වලදී කෝට්ටේ රජු වූ බුවනෙකබාහු පෘතුගීසීන්ගේ සහාය පැතූ අතර මායාදුන්නේ මුස්ලිම්වරුන්ගේ (කැලිකට්හි සැමොරින්ගේ ආධාර) සහාය ලබා ගැනීම. මේ සටන්වලින් බුවනෙකබාහු ජයගැනීම.
- ❖ 1550 බුවනෙකබාහුගේ මරණින් පසු ඔහුගේ මුණුබුරු ධර්මපාල කෝට්ටේ රජකමට පත්වූ අතර 1557 දී කතෝලික දහම වැළඳගත් ඔහු පෘතුගීසීන්ට බෙහෙවින් අවනත පාලකයෙකු වීම.
- ❖ මායාදුන්නේ හා සීතාවක රාජසිංහ යටතේ සීතාවක රාජ්‍යයේ ව්‍යාප්තියක් ඇති වූ අතර සීතාවක පාලකයෝ කෝට්ටේ පාලන බලය කොළඹට පමණක් සීමා කිරීමට සමත් වූහ.
- ❖ එහෙත් ඉන් අනතුරුව සීතාවක රාජ්‍යය සීඝ්‍ර පරිහානියකට පත්වීම. මේ අතරතුර ධර්මපාල මුළුමනින්ම පෘතුගීසීන්ගේ රූකඩ පාලකයෙකු බවට පත්වීම හා 1580 දී ඔහු තෑගි ඔප්පුවකින් පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යය පවරා දීම.
- ❖ ඒ අනුව, 1597 ධර්මපාලගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන් අතට පත්වීම.
- ❖ 1597 දී කෝට්ටේ ප්‍රධානීන් සහ පෘතුගීසීන් අතර ඇති වී යයි කියනු ලබන 'මල්වානේ ගිවිසුමෙන්' පෘතුගීසීන් සිය අභිමතාර්ථ සාධනය කරගැනීම.
- ❖ කෝට්ටේ රාජ්‍යයේ බලය තහවුරු කරගැනීමෙන් පසුව මෙරට පැවති දේශීය පාලන සංස්ථා උපයෝගීකර ගනිමින් පෘතුගීසීන් මෙරට වෙරළබඩ ප්‍රදේශවල පාලනය ගෙනයාම.

<u>යාපනය</u>

- ❖ පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධිය වන විට යාපන අර්ධද්වීපය, පුත්තලම හා ත්‍රිකුණාමලය වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන ආකාරයට යාපන රාජධානිය වර්ධනය වී තිබීම. එවකට යාපනය පරරාජසේකරම් යටතේ පැවතීම.
- ❖ 1543 දී සංකිලිට එරෙහිව මාර්ටින් අපොන්සෝ ද සූසා ආක්‍රමණයක් එල්ල කිරීම.
- ❖ 1560 දී කොන්සතන්තීනු ද සා බ්‍රැගන්සා එල්ල කළ ආක්‍රමණය මගින් පළමුවන සංකිලි පරාජය කොට, පෘතුගීසීන් තමන්ට අවනත පෙරියපුල්ලේ ශෙගරාශශේකරන් නම් පාලකයා පත් කිරීම.
- ❖ යළිත් 1591 දී මැන්ඩොන්සා එල්ල කළ ආක්‍රමණයෙන් පසු අවනත පාලකයෙකු ලෙස එදිරිමානසිංහම් පත්කිරීම.
- ❖ 1619 දී පිලිප් ද ඔලිවේරා විසින් දෙවන සංකිලි මර්දනය කොට යාපන රාජධානියේ පෘතුගීසි බලය තහවුරු කිරීම.

මෙසේ දිවයිනේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් විසින් ස්වකීය බලය ස්ථාපනය කරන ලදී.

**(ලකුණු 16 යි)**

7. "දෙවන රාජසිංහ රජු මීරිස් දී ඉඟුරු ගත්තේ ය."

(i) දෙවන රාජසිංහ ළමා කාලයේ දී හැඳින්වූ නම කුමක්ද?

මහා අස්ථාන

**(ලකුණු 01 යි)**

**(ii) දෙවන රාජසිංහ රජුගේ පියා සහ මව නම් කරන්න.**

සෙනරත් රජු සහ කුසුමාසන දේවිය (දෝන කතිරිනා)

**(ලකුණු 02 යි)**

**(iii) උඩරට රජු සහ ලන්දේසීන් අතර අත්සන් කරන ලද 1638 ගිවිසුම සැකෙවින් දක්වන්න.**

❖ වෙස්ටර්වෝල්ට් ගිවිසුම නමින් හඳුන්වනු ලබන මෙම ගිවිසුම 1638 මැයි 23 දා මඩකලපුවේදී අත්සන් තැබීය.

❖ මෙම ගිවිසුමේ ප්‍රධාන වගන්තිවල සාරය මෙසේය:

- ලන්දේසීන්ගේ හා සිංහලයන්ගේ පොදු සතුරා ලෙස පෘතුගීසීන් සැලකීම, පෘතුගීසීන් ලංකාවෙන් පලවාහැරීම සඳහා ලන්දේසීන් සිය ආධාර ලබාදීම හා ලන්දේසීන් විසින් උඩරට රජු ලක්දිව පාලකයා ලෙස පිළිගනු ලැබීම.
- පෘතුගීසි බලකොටු අල්ලාගැනීමෙන් පසු ඒවායේ තිබූ වස්තුව දෙපාර්ශවය අතර සමව බෙදාගැනීම.
- එම බලකොටුවල 'රජුගේ කැමැත්ත ඇති නම් පමණක්' (මෙම වාක්‍යාංශය ලන්දේසි පිටපතේ ඇතුළත් කොට නොතිබුණි) ලන්දේසි සේනා රැඳවීම.
- එම බලකොටු ප්‍රතිසංස්කරණයට යන වියදම රජු විසින් දැරීම හා ඒවායේ ආරක්ෂාවට යෙදවූ ලන්දේසි භටයන්ට රජු විසින් වැටුප් ගෙවීම.
- සමාගම ලංකාවේ සටන් සඳහා දරණ වියදම් කුරුඳු, ගම්මිරිස් ආදී කුළුබඩුවලින් ගෙවීම.
- උඩරට රාජධානිය තුළ වෙළෙඳාම් කිරීමේ සම්පූර්ණ අයිතිය ලන්දේසීන්ට ලබාදිය යුතුය; වෙනත් විදේශීය ජාතියක් සමග වෙළෙඳාම් නොකළ යුතුය; කුරුඳු, ඇත්දත්, මී ඉටි ලන්දේසීන්ට පමණක්ම ලබාදිය යුතුය.

(මෙම පිළිතුර සඳහා මෙකී ප්‍රධාන කරුණුවලින් කිහිපයක් අන්තර්ගතව තිබීම ප්‍රමාණවත් වේ)

**(ලකුණු 04 යි)**

**(iv) පෘතුගීසීන්ට සහ ලන්දේසීන්ට එරෙහිව දෙවන රාජසිංහ රජු අනුගමනය කළ ප්‍රතිපත්තිය විස්තර කිරීමට ඉහත සඳහන් උද්ධෘතය කෙතෙක් දුරට යෝග්‍යදැයි පරීක්ෂා කරන්න.**

❖ තම අරමුණ වූ පෘතුගීසීන් ලංකාවෙන් පලවාහැරීම සඳහා විදේශ බලයක සහාය අවශ්‍ය බව අවබෝධ කරගත් රජු ලන්දේසීන් සමග 1638 ගිවිසුමට එළඹුණේය.

❖ මේ ගිවිසුමෙන්, ලන්දේසීන්ගෙන් ලබාගනු ලබන ආධාර වෙනුවෙන් දිවයිනේ වාණිජ කටයුතුවල තනි අයිතිය ලන්දේසීන්ට පවරා දීමට සිදුවිය.

❖ මුලදී ගිවිසුමට අනුව ක්‍රියා කළ ලන්දේසීහු පසුව එය කඩකරමින් පෘතුගීසීන් සතුව තිබී අල්ලාගත් ප්‍රදේශ තමන් වෙතම තබාගත්හ.

❖ ඒ අනුව පෘතුගීසීන් පළවාහැරීමට රජු සමත් වුවත් දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ ගණනාවක් රජුට අහිමි වීම වීම; එසේ වුවත් යම් යම් ප්‍රදේශ උඩරටට ඈඳාගැනීමටද රජු සමත්විය.

පෘතුගීසීන් පළවා හැර ලන්දේසීන්ට පහතරට බලය අල්ලා ගැනීමට ඉඩදීමෙන් උඩරැටියන් කළේ ''මිරිස් දී ඉඟුරු ගැනීමකැ'' යි 17 වන සියවසේ උඩරට ප්‍රස්තාව පිරුළක් ඇති වූ බව **රොබර්ට් නොක්ස්** සඳහන් කරයි.

**'මිරිස් දී ඉඟුරු ගත්තා වගේ' යන ප්‍රකාශය භාවිතයට ගැනෙන්නේ මේ තත්ත්වය විස්තර කිරීමටයි. කිසියම් අපේක්ෂකයෙකු ඉහත සඳහන් කරුණුවලට අමතරව මෙම ප්‍රකාශය විස්තර කිරීම සිදුකොට ඇත් නම් වැඩි ලකුණු ලබාදිය යුතුය.**

කෙසේ වෙතත්, ලන්දේසීන්ගේ සම්බන්ධතාව උඩරටට - එකල වැසියන් විශ්වාස කළ බවට නොක්ස් දක්වා ඇති පරිදි - මුළුමනින්ම සාමකාමී වූයේ නම් නැත. එහෙත් පෘතුගීසීන්ට සාපේක්ෂව උඩරට සමග ලන්දේසීන්ගේ සම්බන්ධතාව මිත්‍රශීලී නැතහොත් හිතකර වූ බව කිව හැකිය.

**(ලකුණු 09 යි)**

**8. දහනව වන සියවසේ දී ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ වර්ධනය සඳහා බලපා ඇති ප්‍රධාන සාධක පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.**

**(i) ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය**

**(ii) ඉඩම්**

**(iii) ශ්‍රමය**

**(i) ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය**

❖ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ වර්ධනයට පදනම දැමීය.

❖ **ප්‍රාග්ධනය**

- මුලදී තනි පුද්ගලයින් කෝපි වගාව ආරම්භ කිරීම.
- පසුව කිහිප දෙනෙකු එකතුවී ප්‍රාග්ධනය යෙදවීම.
- කෝපි කර්මාන්තයේ වර්ධනය සමග ආරම්භ වන වාණිජ බැංකු මගින් වතු වගාව සඳහා ණය ලබාගැනීම.

❖ **ව්‍යවසායකත්වය**

- ලන්දේසි පාලන කාලයේ සිට ගැමියන් ගෙවතු වගාවක් ලෙස කෝපි වගා කිරීම
- සාපේක්ෂව කුඩා පරිමාණ වැවිලිකරුවන් බිහිවීම.

- 1833ට පෙර රජයේ වියදමෙන් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පර්යේෂණ මට්ටමින් කෝපි වගා කිරීම.
- කෝල්බෲක්-කැමරන් නිර්දේශවලට අනුව රජයේ වියදම් අඩුකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් ඇතුළු රජයේ නිලධාරීන්ට හිමිව තිබූ ඇතැම් වරප්‍රසාද ඉවත් කරන ලද අතර ඒ වෙනුවට ඔවුන්ට වතු වගාව හෝ වෙනත් ව්‍යවසායක නියැලීමට අවසර ලබාදීම; මේ හේතුකොටගෙන ඇතැම් සිවිල් සේවා නිලධාරීන් සහ රජයේ ඇතැම් නිලධාරීන් කෝපි වගාවේ නියැලීම.
- 1833 වහල් ක්‍රමය අහෝසි කිරීම හේතුකොටගෙන බටහිර ඉන්දීය කොදෙව්වල කෝපි කර්මාන්තය පරිහානියට පත්වීමෙන් පසු එම වැවිලිකරුවන් අතරින් ඇතැමෙක් ලංකාවේ ආයෝජනය කිරීම.
- කෝපි වගාවේ වර්ධනයත් සමග ජෙරොනිස් ද සොයිසා වැනි දේශීය ව්‍යවසායකයන්ද බිහිවීම.

**(ii) ඉඩම්**

❖ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන වෙනස් වූ මෙරට යටත්විජිත ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්තිය මගින් රජයේ ඉඩම් හා සම්බන්ධ වෙළඳපළක් නිර්මාණය වීම.

❖ 'කෝපි උමතුව' ආරම්භ වූ 1835 ත් එය උච්ඡස්ථානයට පත් වූ 1842 ත් අතර ඉඩම් සඳහා විශාල ඉල්ලුමක් ඇතිවීම.

❖ 1840 අංක 12 දරන රජයේ ඉඩම් අත්පත් කර ගැනීම වැළැක්වීමේ ආඥාපනත මගින් යටත්විජිත ආණ්ඩුව විසින් උඩරට ඇතැම් ඉඩම් රජයට පවරාගැනීම; මෙම ඉඩම් ඉතා අඩු මිළකට වැවිලිකරුවන්ට විකිණීම.

❖ කෝපි වගාවට හිතකර පරිසරයක් පැවති උඩරට ප්‍රදේශ ආශ්‍රයෙන් විශාල ඉඩම් වෙළෙඳපොලක් වර්ධනය වීම.

**(iii) ශ්‍රමය**

❖ කෝල්බෲක්-කැමරන් නිර්දේශවලට අනුව රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.

❖ එහෙත් උඩරට ගැමියන් වතුවල කම්කරුවන් ලෙස සේවය කිරීමට ඉදිරිපත් නොවීම; මේ නිසා ඉතා අඩු වැටුපකට දකුණු ඉන්දියාවෙන් ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම.

❖ කෝපි පැළ සිටුවීමෙන් පසු දකුණු ඉන්දියානු ශ්‍රමිකයින් ඉන්දියාවට ගොස් අස්වැන්න නෙලන කාලයේ නැවත පැමිණීම.

❖ මෙය අඛණ්ඩ හා විශ්වාසදායී සැපයුමක් සහිත ශ්‍රම මූලාශ්‍රයක් වීමේ වාසිය වැවිලිකරුවන්ට හිමිවීම.

**(ලකුණු 16 යි)**

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පෘතුගීසීන් අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තිය
(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර පැවති සබඳතා
(iii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කරගැනීම
(iv) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක

(ලකුණු 2×8 = 16 යි)

(i) පෘතුගීසීන් අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තිය

❖ 16 වන සියවස මුල් කාලයේ පෙරදිග රටවල කතෝලික දහම ව්‍යාප්ත කිරීමේ වගකීම එවක සිටි පාප් වහන්සේ විසින් පෘතුගීසීන්ට පවරා දෙනු ලැබ තිබිණි ('තෝඩසිලාස් ගිවිසුම' - Tordesillas Treaty - ක්‍රි. ව. 1494 දී සයවන ඇලෙක්සැන්ඩර් පාප් වහන්සේ විසින් කේප් වර්ඩ් දිවයින ඔස්සේ මනඃකල්පිත රේඛාවකින් ලෝකය දෙකට බෙදා, නැගෙනහිර පැත්ත පෘතුගීසීන්ටත් බටහිර පැත්ත ස්පාඤ්ඤයන්ටත් ආගම ප්‍රචාරය සඳහා වෙන් කර දෙනු ලැබිණි).

❖ මේ අනුව, මෙරට මුහුදුබඩ කලාපය තමන් අතට පත්කර ගැනීමේදී පෘතුගීසීන්ගේ එක් අරමුණක් වූයේ කතෝලික ආගම ප්‍රචාරය කිරීමයි.

❖ ලංකාව තුළ පෘතුගීසීන් ගෙනගිය ආගමික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් පැවති බව පෙනේ:

1. ස්වකීය පාලනයට අවනත වැසියන් පිරිසක් බිහිකර ගැනීම.
2. තම ආණ්ඩුව හා කෝට්ටේ ජනතාව සම්බන්ධ කළ පුරුක වූ ප්‍රභූන් කතෝලික ආගමට හරවාගැනීම මගින් ස්වකීය දේශපාලන බලය තහවුරු කරගැනීම (ධර්මපාල රජු ඇතුළු රාජකීයයන් / අලගියවන්න වැනි රාජ්‍ය නිලධාරීන් / ලස්කිරිඤ්ඤ භටයන්).

❖ ක්‍රි. ව. 1543 දී ධර්මපාල කුමරුගේ පිළිරුවට ඔටුණු පැළඳවීම පිණිස පිටත්ව ගිය දූත පිරිස ආපසු එනවිට ඔවුන් සමග ෆ්‍රැන්සිස්කන් පූජකයන් කිහිප දෙනෙකු මෙරටට පැමිණීම මෙහිලා වැදගත් සිදුවීමකි.

- පසුව ෆ්‍රැන්සිස්කන් පූජකවරුන් විසින් පල්ලි කේන්ද්‍ර කොටගත් පැරිෂ් පැසල් ආරම්භ කොට ඒ ඒ ප්‍රදේශවල ළමුන් කතෝලික අධ්‍යාපනය තුළින් ආගමට හරවාගැනීම සිදු කෙරිණි.

❖ ආගම ව්‍යාප්ත කිරීමෙහිලා පෘතුගීසීන් විවිධ උපක්‍රම අනුගමනය කිරීම:

- අධ්‍යාපනය, දේශන පැවැත්වීම, නාට්‍ය රඟදැක්වීම වැනි උපක්‍රම මගින් ජනතාව එම ආගමට ආකර්ශණය කරගැනීම.
- තිළිණ, සම්මාන, නිලතල ප්‍රදානය ආදිය මගින් කතෝලික ආගම වැළඳගැනීමට ජනතාව පෙළඹවීම.
- කතෝලික ආගම වැළඳගත්තවුන් මරාල බද්ද වැනි බදුවලින් නිදහස් කිරීම.
- නඩු කටයුතුවලදී කතෝලිකයන්ට විශේෂ සැලකිලි දැක්වීම - ක්‍රි. ව. 1618 දී කිසිදු කතෝලිකයෙකුට මරණ දඬුවම පැනවීම නොකළ යුතුය යනුවෙන් ආඥාවක්, ජෙසුයිට් නිකායික පූජකයන්ගේ මැදිහත්වීමෙන් සම්මත කිරීම.

- ආණ්ඩුව අනුදත් ආගම හැරුණු කොට වෙනත් ආගම් ඇදහීම වැළැක්වීම - ස්වකීය පාලනයට යටත් වූ ප්‍රදේශවල පැවති තමන් විසින් 'මිථ්‍යාදෘෂ්ටීන්' යයි හඳුන්වන ලද අන්‍යාගම්වලට අයත් පූජනීය ස්ථාන විනාශ කිරීම (කැලණි විහාරය, නවගමුව, මුන්නේශ්වරම්).

❖ යාපන ප්‍රදේශයෙහි මොවුන් විසින් අනුගමනය කරන ලද ආගමික ප්‍රතිපත්තිය ඉතා දැඩි එකකි - 1591 දී පරරාජසේකරම් පත් කරන ලද්දේ කතෝලික ආගම ප්‍රචාරයට ඉඩ දෙන බවට එකඟතාවක් ඇතිවය (ඔහු බලයෙන් නෙරපා දැමීමට එක් හේතුවක් වූයේ මෙම එකඟතාවට අනුව ඔහු කටයුතු නොකිරීමයි.).

❖ සාපේක්ෂ වශයෙන් බලන කල පෘතුගීසීන්ගේ මෙම ආගමික ප්‍රතිපත්තිය සාර්ථක වී යයි තර්ක කළ හැකිය.

**(ලකුණු 08 යි)**

**(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර පැවති සබඳතා**

❖ කීර්ති ශ්‍රී රාජසිංහ, නායක්කර් රාජවංශයට අයත් උඩරට රජපත් දෙවැන්නාය (ක්‍රි.ව. 1747-1781).

❖ උඩරට සහ ලන්දේසීන් අතර විරුද්ධවාදීකම් මතුවී ඒවා යුද්ධ තත්ත්වයක් දක්වා වර්ධනය වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේදීය.

❖ 1750 දශකය වන විට රජු හා ලන්දේසීන් අතර සබඳතා අන්තයටම පිරිහී තිබූ අතර රජු විසින් ලන්දේසීන්ට උඩරටට පැමිණීම තහනම් කරන ලදී.

❖ රජු විසින් පහත රට ප්‍රදේශ ආක්‍රමණය කර හංවැල්ල සහ මාතර බලකොටුව අල්ලා ගැනීම. රජු ලන්දේසීන් මෙරටින් පිටමං කිරීම සඳහා මදුරාසියේ මුස්ලිම් පාලකයා වූ නවාබ්ගෙන් යුධ ආධාර ඉල්ලූ නමුත් එය අසාර්ථක විය.

❖ ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකු වශයෙන් මදුරාසියේ සේවය කළ ජෝන් ෆයිබස් උඩරටට පැමිණි දූත මෙහෙවර අවස්ථාවේ 1762 දී මෙසේ වෙනත් විදේශ බලවේගයක සහාය ලබා ගැනීමට කටයුතු කළත් එයද අසාර්ථක විය.

❖ ලන්දේසීන් හා උඩරට රාජ්‍යය අතර 1760-1765 අතර කාලයේ යුද්ධ ඇති වීම.

❖ 1766 පෙබරවාරි 14 දින හඟුරන්කෙත දී දෙපාර්ශවය ගිවිසුමකට එළඹි අතර එම ගිවිසුමෙන් රජුට කොන්දේසි 14 කට එකඟ වීමට සිදු වීම.

- කොළඹ, ගාල්ල, මාතර, යාපනය යන දිශාවන්ද කල්පිටිය, ත්‍රිකුණාමලය, මන්නාරම යන ප්‍රදේශද ලන්දේසීන් සතු විය යුතු වීම.
- උඩරට රජුට අයත් ප්‍රදේශවල මුහුදු වෙරළෙහි සිට ගව්වක් (සැතපුම් 4 ක්) පමණ බිම් තීරයක් ලන්දේසීන්ට පවරා දිය යුතු වීම.
- උඩරට රජුට ලන්දේසීන් හැර වෙනත් විදේශීය ජාතියක් සමඟ කිසිදු වෙළඳාමක් කළ නොහැකි වීම.

(මෙම ගිවිසුම ටික කලෙකින් අසාර්ථක විය.)

❖ කෙසේවෙතත්, ස්වකීය ආගමික කටයුතුවලදී රජු ලන්දේසීන්ගේ සහාය ලබාගත්තේය - උපසම්පදාව යළි ඇතිකරනු වස් 1753 දී සියම් දේශයෙන් උපාලි තෙරණුවන් ඇතුළු පිරිස කැඳවාගෙන ඒම සඳහා ලන්දේසි නාවික සහාය ලබාගැනීම.

**(ලකුණු 08 යි)**

### (iii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කරගැනීම

- ❖ 18 වන සියවස මැද වනවිට, පිරිහී තිබූ උඩරට-ලන්දේසි සබඳතා හේතුකොටගෙන උඩරට පාලකයන් නැවතත් විදේශ බලවේගයක සහාය පැතීමට පෙළඹීම.
- ❖ ඒ සඳහා ඉංග්‍රීසීන් වෙත යොමු වීම සහ උඩරටට ඉංග්‍රීසි දූත ගමන් කිහිපයක් සිදුවීම (1762 - ජෝන් පයිබස් / 1782 - හියු බොයිඩ් / 1795 - රොබට් ඇන්ඩෘස්).
- ❖ කෙසේවෙතත් මෙම උත්සාහයන් සාර්ථක නොවූයේ ඉංග්‍රීසීන් තුළ ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ උනන්දුවක් වර්ධනය වී නොතිබූ බැවිනි.
- ❖ 1795 දූත මෙහෙවර සිදුවන විට නම් එම උනන්දුව පැවතියත් මුහුදුබඩ ලන්දේසි බල ප්‍රදේශ අත්පත් කරගැනීමට උඩරට සහයෝගය ඉංග්‍රීසීන්ට අවශ්‍ය නොවන වාතාවරණයක් නිර්මාණය වී තිබිණි. මෙම අලුත් උනන්දුවට ප්‍රධාන හේතුව වූයේ ඉන්දියාවේ බ්‍රිතාන්‍ය බලයට එල්ලවන ප්‍රංශ තර්ජනය හමුවේ ත්‍රිකුණාමල වරාය බ්‍රිතාන්‍යයන්ට යුධෝපායමාර්ගික වශයෙන් වැදගත් වීමයි.
- ❖ 1796 දී දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් වෙතින් ලබාගැනීමට බ්‍රිතාන්‍යයන් සමත් විය.
- ❖ 1798 දී උඩරට පාලකයා වශයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පත්විය.
- ❖ 19 වන සියවස එළඹෙන විට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය වන අතර ක්‍රමයෙන් බ්‍රිතාන්‍යයන්ගේ අවධානය උඩරට අත්පත් කරගැනීම කෙරෙහි යොමු වේ. ඊට බලපෑ හේතු කිහිපයකි:
  - ▪ මුහුදුබඩ ප්‍රදේශවල තම පාලනයට රට මැද ස්වාධීන ස්වදේශීය පාලන ඒකකයක් පැවතීම බාධාවක් බව කල්පනා කිරීම (1797/98 මුදලිවරුන්ගේ කැරැල්ලට උඩරට පාලකයා සහාය දුන්නේ යයි විශ්වාස කිරීම).
  - ▪ වාණිජ අරමුණු (කුළුබඩු ලබාගැනීම).
  - ▪ කොළඹ හා ත්‍රිකුණාමලය යා කොට මහාමාර්ගයක් ඉදිකිරීමට උඩරට රාජධානිය පැවතීම බාධාවක් වීම.
  - ▪ උඩරට-ප්‍රංශ මිත්‍රත්වයක් ගොඩනැගෙතියි පැවති සැකය.
- ❖ මුලින්ම නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ සමයේ (1803) මැක්ඩොවල් සෙන්පති යටතේ ආක්‍රමණයක් සඳහා අසාර්ථක උත්සාහයක් ගැණිනි.
- ❖ මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා යටතේ උඩරට සමග මිත්‍රශීලී සම්බන්ධතා පවත්වා ගන්නා අතරේම උඩරට රාජධානිය අභ්‍යන්තරයේ ගැටුම් නිර්මාණය කිරීමේ උපායයක් අනුගමනය කිරීම (මේ සඳහා ජෝන් ඩොයිලි යෙදවීම).
- ❖ මේ වනවිට ක්‍රමයෙන් උඩරට ඇතැම් ප්‍රබල රදළයන් හා රජු අතර ගැටුම් වර්ධනය වීම (පිළිමතලව්වේ හා පසුව ඇහැලේපොළ). බ්‍රිතාන්‍යයන් විසින් මෙම තත්ත්වය, විශේෂයෙන්ම ජෝන් ඩොයිලිගේ මැදිහත් වීමෙන් ස්වකීය වාසියට හරවාගැනීම.
- ❖ රජුගේ ඇතැම් ක්‍රියා භික්ෂූන් වහන්සේගේ හා ජනතාවගේ අප්‍රසාදයට හේතු වීම (1814 සබරගමු කැරැල්ල මර්දනය කළ ආකාරය / ඇහැලේපොළ පවුලේ සාමාජිකයන් ඝාතනය / නුවර වැව තැනීමේදී ඇති වූ අප්‍රසාදය / රජු නායක්කර් ඥාතීන්ට දැක් වූ පක්ෂග්‍රාහී බව).
- ❖ ඇහැලේපොළගේ සහාය බ්‍රිතාන්‍යයන්ට හිමිවීම සහ 1815 දී බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසින් උඩරට අත්පත් කරගැනීමට පියවර ගැනීම.
- ❖ 1815 මාර්තු 10 අත්සන් තබා අවසන් වූ උඩරට ගිවිසුම මගින් බ්‍රිතාන්‍යයන් උඩරට අත්පත් කරගැනීම තහවුරු කරගැනීම.

❖ ඒ සමගම සමස්ත දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත්විජිතයක් බවට පත්වීම.

(ලකුණු 0

(iv) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක

❖ සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපනය හදාරා එහි දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් පිළිගැනීමට ලක්විය. උ ක්‍රිස්තු භක්තිකයෙකු වුවද හෙතෙම පසුව බුද්ධාගම වැළඳගත්තේය.

❖ දේශපාලනයට ප්‍රවිශ්ට වීමෙන් පසු කොළඹ මහනගර සභාවේ මරදාන ආසන නියෝජිතයා වශයෙන් තේරී පත් වූයේය.

❖ සිංහල මහ සභාව පිහිටුවීය.

❖ එක්සත් ජාතික පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි මොහු, 1951 දී ඉන් ඉවත් ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තේය.

❖ 1956 මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ සන්ධානය පිහිටුවාගෙන තරඟ කොට ජයගත් මොහුගේ මැතිවරණ ව්‍යාපාරය 'සඟ, ගුරු, ගොවි, කම්කරු' යන පංච මහා බලවේගය එක්තැන් කිරීමක් සේ සැලකේ.

❖ මැතිවරණයෙන් ජයගත් බණ්ඩාරනායක මහතා අගමැතිවරයා ලෙස පත් වූ අතර මෙම ආණ්ඩුව ලංකාවේ එතෙක් පැවති ආණ්ඩුවට වඩා වෙනස් ස්ථාවරයක් ගනිමින් පුළුල් ප පරිවර්තනයකට මුල පිරීය.

❖ ඒ වනතෙක් බ්‍රිතාන්‍යය සමග පැවති ආරක්ෂක ගිවිසුම ඇතුළු ව්‍යවස්ථාමය බැඳීම් එම ඉවත් කළේය. ජනසතු කිරීමේ ව්‍යාපාරය තවත් වැදගත් පියවරකි.

❖ මොහුගේ රජය සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීමට ගත් පියවර පසුකාලී ලංකාවේ දේශපාලන අර්බුදවලට හේතු විය.

❖ විදේශ ප්‍රතිපත්තියේ දී මොහු බල කඳවුරුවලට සම්බන්ධ නොවී නොබැඳි ප්‍රතිපත්ති ලංකාව මෙහෙය වූ අතර නේරු, සුකර්නෝ ආදී වූ සෙසු ලෝක නායකයන් සමග නෙ ජාතීන්ගේ ව්‍යාපාරය ඇති කිරීමට මූලික පසුබිම සකස් කළේය.

❖ 1959 දී වෙඩි ප්‍රහාරයකට ලක්ව ඝාතනය විය.

(ලකුණු 0

*******

❖ ඒ සමගම සමස්ත දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත්විජිතයක් බවට පත්වීම.

(ලකුණු 08 යි)

**(iv) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක**

- ❖ සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා එහි දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් පිළිගැනීමට ලක්විය. උපතින් ක්‍රිස්තු භක්තිකයෙකු වුවද හෙතෙම පසුව බුද්ධාගම වැළඳගත්තේය.
- ❖ දේශපාලනයට ප්‍රවිශ්ට වීමෙන් පසු කොළඹ මහනගර සභාවේ මරදාන ආසනයේ නියෝජිතයා වශයෙන් තේරී පත් වූයේය.
- ❖ සිංහල මහ සභාව පිහිටුවීය.
- ❖ එක්සත් ජාතික පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි මොහු, 1951 දී ඉන් ඉවත් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තේය.
- ❖ 1956 මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ නම් සන්ධානය පිහිටුවාගෙන තරඟ කොට ජයගත් මොහුගේ මැතිවරණ ව්‍යාපාරය 'සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු' යන පංච මහා බලවේගය එක්තැන් කිරීමක් සේ සැලකේ.
- ❖ මැතිවරණයෙන් ජයගත් බණ්ඩාරනායක මහතා අගමැතිවරයා ලෙස පත් වූ අතර මෙම නව ආණ්ඩුව ලංකාවේ එතෙක් පැවති ආණ්ඩුවට වඩා වෙනස් ස්ථාවරයක් ගනිමින් පුළුල් සමාජ පරිවර්තනයකට මුල පිරීය.
- ❖ ඒ වනතෙක් බ්‍රිතාන්‍යය සමග පැවති ආරක්ෂක ගිවිසුම ඇතුළු ව්‍යවස්ථාමය බැඳීම් එම රජය ඉවත් කළේය. ජනසතු කිරීමේ ව්‍යාපාරය තවත් වැදගත් පියවරකි.
- ❖ මොහුගේ රජය සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීමට ගත් පියවර පසුකාලීන ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදවලට හේතු විය.
- ❖ විදේශ ප්‍රතිපත්තියේ දී මොහු බල කඳවුරුවලට සම්බන්ධ නොවී නොබැඳි ප්‍රතිපත්තියකට ලංකාව මෙහෙය වූ අතර නේරු, සුකර්නෝ ආදී වූ සෙසු ලෝක නායකයන් සමග නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය ඇති කිරීමට මූලික පසුබිම සකස් කළේය.
- ❖ 1959 දී වෙඩි ප්‍රහාරයකට ලක්ව ඝාතනය විය.

(ලකුණු 08 යි)

*******